# ජයසේන කොඩිතුවක්කුගේ කවි

## දෙරටක සිත

දුක සැප බලන්නට දරුවන්ගේ නැවතත්
හිත දුන් නිසා කරදර කොතෙකුත් තිබුණත්
අතහැර දමා ටික දොහකට හැම දේමත්
ගතවිය ගුවන් සමගින් සෙනෙහැති බිරිඳත්

හැඩවෙයි ඔසී රට සමගින් වසත් කල
හිනැහෙ යි පරිසරය පුරවා මලිනි පල
සුව දෙයි හමන මඳනළ ගෙනඑන සිසිල
පිබිදෙයි සැමගෙ සිත් ලෙස මල් පිපුන විල

දුකයි සිතට සිහිවන විට අපේ රට
හිගයි වතුර බොන්නට ගම්බද අයට
වදියි ගමට වන අලි දිය පිපාසෙට
දිවයි වනේ ගහකොළ ලැව් ගිනි ජයට

සංකලනයකි නෙක රටවල මිනිසුන් ගේ
ගංදිය මුහුදු ජලයට එක් වුනා වගේ
සංවේදීව වෙසෙනා හැම දෙනම වගේ
ලංකාවට අපේ හොඳ පාඩමකි අගේ

හතළිස් අවේ නිදහස ලැබුණු දා පටන්
නිල් කොළ දෙපිරිසම බලයට කළා සටන්
දියුණුව රටේ නොව උන්ගේ වැඩෙන ලෙසින්
කළ හැම දෙයින් ජන හදවත් තැවෙති දුකින්

එක් වෙමු සැවොම අපි එකමුතු හැඟීමෙන්
දුරලමු සියලු වංචා දූෂණ සමගින්
කැපවෙමු නීති ගරුකව එකිනෙකා කෙරෙන්
ගොඩගමු අපේ ලක්මව මේ අගාධයෙන්

## සංවත්සරය දා මතකය

දිවගියා සිත මට හොරා
ඒ මතක සිතුවම් කරා
වසර තිස් හතකට කලින්
මැවුනු රන් රූ පෙළින්
පියවුනා දෑසම හෙමින්
දිස්වුනා මෙන් සිහිනයෙන්

නාද විය පල්ලියේ සීනුව
සාදයක වග කියා පෑමටම
නෑසියන් පිරීගිය
දෙව්මැදුර කෙළවරේ
අභියසදි අල්තාරෙ
ගැනුනි අතිනත අපේ

මංගල ගී හඬින්
හැමගෙ පිපි නෙත් මලින්
දෙව්මැදුර සැරසෙද්දි
ඇරඹුනා යුග දිවි අපේ
ආදරයෙ තේමාව
ලියා සෙල්ලිපියක රනින්

සඳ නොනැගි රෑ අහසෙ
පුංචි තරු දෙකකි අපි
පැතුම් පිරි සිත් අපේ
නිහඬවම ලංවෙලා
හෙට දවස ගැන යමක්
අදිටන් කළාදෝ
සිතෙයි සැමරුම් දිනේ

## ඔසී රටේ මුනුබුරා

ඉපදුන ඔසි රට මුනුබුරු මල් කැකුළ
පතුරන එළිය මිණි පහනකි නිවස තුළ
ගතවුන මාස හය දුටු සුරතල් කොමළ
පවසන පද වැළකි මේ මගෙ සිත අවදිකළ

වයසින් එකහමාරකි අවුරුදු පුතුට
ගොතමින් වචන එක දෙක හුරු වෙයි බසට
දුවමින් ගේ පුරා සුරතල් පාන විට
මනසින් යනව අපි අපගේ බලයට

දන්නා වචන දෙක තුන දවස තිස්සෙම
හඬගා කියයි පෙන්වා දඟකාරකම
පෙන්වා කැකුළු දත් මුව පිරි සිනහවම
ගෙවුනා දවස අපෙ සතුටින් නො දැනීම

සෙනෙහස නිසා නැළවිලි ගී කියැවෙනවා
ඒවා අසා පුතු නිදි ලොව සැනසෙනවා
නිහඬව සිනහ මල් සිහිනෙන් පුබුදනවා
සුර කුමරියන් සමගින් පුතු නැළවෙනවා

එක එක අරන් සෙල්ලම් බඩු විටින් විට
බල බල ඒවයේ හැඩ රුව හැම අතට
නෙක නෙක වැඩ දමා සෙල්ලම් පාන විට
දැක දැක ඉන්න ලද පින ඇති වෙන කුමට

ටික දොහකටයි ආවේ කැන්ගරු දේසේ
දැක සැනසෙන්න දරු සුරතල් සිත ඇතිසේ
දුක නැහැ සියළු දරුවන් ඇත සන්තෝසේ
රැක ගනු සමන් දෙවියනි දරුවන් නිසිසේ

## මව්බිම රැක ගමු

ඉපදුන හැදුන මව් බිම ගැන සිතෙන විට
තෙරපෙන වේදනා සිත තුළ එක දිගට
රට ගැන සිතන අයගේ ඇස් අරවන්ට
වලිකන මගේ සිත ඇරුනා පන්හිදට

සිව් දෙස ගොවිතැනට සෙනසුරු ලබපු හැටි
වැව් ටික පාසි රොන් මඩ ගිළ ගන්න හැටි
නැව් වල හෙට රටින් ගෙන එන හාල් මිටි
පව් කාරයන් හට පුද දෙයි මොණරු මිටි

සිංහල එකම රට ලොව බුදු දහම ඇති
දැන් දැන් රටේ බුදු සසුනට නැනක් නැති
පෙන්වා මුදල් මිසදිටු බල නැගෙනු ඇති
දැන්වත් නැගිටියව් පෙන්වා සිහල ගති

එකයි දෙකයි සිංහල පවලකට ළමයි
දුකයි හිතට අත මිට හිඟ නිසා තමයි
හතයි අටයි මිසදිටුවන් හදන පැටවු
හෙටයි රටට කොඩිවින ඇස් ඇරල බලව්

වද විඳිනවා මැද පෙරදිග සිංහල කතුන්
අද වැඩි උගත් දරුවන් රට හැරල ගිහින්
නිදහස ලැබුණු දා සිට රට උකස් කරන්
උදහස් නොවිද තවමත් අපෙ සිංහල පුතුන්

තව තව කල් ගියොත් සිරිලක් අම්ම අපේ
විඳ විඳ සියළු නොපනත් කම් කරන තොපේ
ඇදහිය නොහැකි ලෙස ඇය දැන් වෙලා හපේ
දැක දැක ඉන්නෙ ඇයි තව මගෙ සිහල පුතේ

එකමුතු වෙයව් දුරලා හැම භේද ගති
රටගැන සිතව් තනතුරුවල නොව් ගැති
හෙට ගැන බලව් ගරු කරමින් සිහල ගති
පෙරමුණ ගනිව් ජනතා හඬ තුළින් සැදී

## සමාවෙන්න අම්මේ මගෙ පමාවට

එළි වෙනකොට එදා මගෙ මතකයෙ ලෙසට
ලැබුණා පණිවුඩය අසනීපයි අම්මාට
සේවා මුරයෙ මම එතකොට ගුවන් තොට
හැකි ඉක්මණින් පිට විය එන්නට ගමට

අද වගෙ තිබුණෙ නැහැ දකුණට අධි වේග
කැද බී වගේ ගියෙ බස් එක අඩු වේග
තද වී සිටියෙ සාඩින් ගාණට සෙනඟ
නද විය දොළහ ගාල්ලට යන අතර මඟ

රෝහල තුළට යන විට මේ ලෙස වෙහෙසී
අම්මගෙ මුහුණ සුදු රෙද්දෙන් තිබුණි වැසී
රත්විය දෙලොව මට බැරි විය කතා කිසී
අක්කා ඉකිගසයි ඇඳ ළඟ දණින් වැටී

අම්මා මෙලොව හැරගොස් පැය භාගයක්
මල්ලී කලින් ආවා නම් ලොකු දෙයක්
කිව්වා මමත් ඔබ දැන් දැන් ආව හැකි
මොනවා වුනත් මරණය කල් දෑ නොහැකි

විසිවිය කඳුළු නෙත් අගටම නො දැනීම
බැරි විය දරන්නට දුක හද තෙරපීම
නැති විය මගේ අම්මා මට සදහටම
තනි විය මගේ ලොව දුක තද කරගෙනම

අවසන් මොහොතේ කළ දං පිං සිහි වීද
නැතිනම් පුතා ගැන සිතමින් දුක් වීද
සසරින් එතෙර වන්නට සිත හැදුනාද
පුතුගෙන් මගේ අම්මට වරදක් වීද

හිරු සඳු වුනේ දිවියට අපෙ අම්මෙ ඔබයි
අප හද තුළින් නොමැකෙන රුව අම්මෙ ඔබයි
නැති බැරි අයට දන්සැළ වුනේ අම්මෙ ඔබයි
මතු බුදු වෙන්නෙ කවදා හරි අම්මෙ ඔබයි

රැක ගම් ඔබේ නම අම්මේ දිවි හිමියෙන්
කැප වෙම් පමුණුවන්නට පිං ඔබේ නමින්
භවයෙක ඉදිරි ඔබ නිවනට යන්න කලින්
පුතු වෙම් ඔබව සරසන්නට සෙනෙහෙ මලින්

ගුලි කර ගෙන සිතේ තිබු ආදරේ පුතුට
එළිවෙන තුරු බලා ඉන්නැති දැක ගන්ට
එනවද කියා අසමින් මග බැලුවාට
සමා වෙන්න අම්මේ මගේ පමාවට

## තනිකම

හිත පාලු ලොවක කිරුළු පළඳලා
තනිකම මගෙ අග බිසව් වෙලා

කවුරුත් නැති මගෙ ලොවේ
තනිකම මගෙ සතුට වේ
දුක සැප දෙක දෝතින් ගෙන
තනිව විඳිනවා

සය වසරක් ගත වුනා
ඇය සදහට නැතිවෙලා
මට ඇය දුන් දරු දෙන්නා
එතෙර තනි වෙලා

දරුවන් දුක සැප අසයි
ගුවනින් රුව ඇස ගැටෙයි
නිසල සිතේ දැහැනින් මම
මොහොතකට මිදේ
වියපත් දිවි මාවතේ
එකට ඉන්නෙ තනිකමයි
අත් හැර දා සියලු දේ
දහමට මගෙ සිත බැදේ
තනිකම එහි ජීවයයි

## ලබන නව වසර

ගිම්හාන උණුසුම හා අත්වැල් බැඳ ලගාවෙන වසර
ශුභ පණිවිඩයක් ගෙන එන්නේ ලෝ සත වෙත පැතිර
ලොවම පොදු සුවිශේෂිත දිනයක් සේ පිළිගන්නා
අතර
ඉමහත් සොම්නසින් ලෝ සත වැළඳ ගනී නව වසර.

ඉකුත් වසර වියපත්ව සමුගෙන සැණෙකින්
වැල්ලේ තැබූ පිය සටහන් මෙන් මැකෙමින්
කළ කී සියලු දේ අතීත ගත වීමෙන්
නව වසර පිළිගනී ලෝකය උද්දාමයෙන්

ශෝක දුක් තැවුල් රෝ බිය කම්පන දුරුව
ස්වභාවික විපත් උවදුරු අනතුරු වපසන නැතුව
සාමය සතුට සංහිඳියාව සුව සෙත කැටුව
සෞභාග්‍යමත් රන් දොරටු විවරවේවා නිරතුරුව

වයසින් දැනුමෙන් අත්දැකීම් ආදිය පසු කරමින්
ඉකුත් වසර පසුවිය ඊයක වේගයක සරින්
කෙමෙන් උදාවෙන නව වසර නව ආකල්ප දරමින්
පෙර මග බලා එය පිළිගනී පැතුම් පොදි ගසමින්

නිමා නොවූ කටයුතු ප්‍රතිනිර්මාණය කරගන්න
පමා නොවී ලිහිලිහියේ වැඩවල නරත වන්න
කාලයේ උපරිම ඵල නෙළාගන්නට යුහුසුලු වන්න
එවිටයි වන වසර අර්ථවත් වන්නේ සතට නිතින

මිනිස්කමේ ජීවන සුවඳ දසත පතුරා
ගෞරවනීය පුද බිමක් සේ සිත් දරා
ආත්මාර්ථකාමී නොව් පරාර්ථකාමිබව වපුරා
පුර හඳ වගේ එළියක් දෙමු දිවිය පුරා

මනුසත්කමේ සොඳුර දැන හඳුනා විඳගන්න
ලෙන්ගතු පවනක් වෙමින් සැම හා එක්වන්න
අධ්‍යාත්මික මෙන්ම භෞතික දියුණුව ලැබගන්න
ජවය දිරිය ශක්තිය කැපකරනු නිතින

දැහැමි පුද්ගලයා ධර්මය විසින් ආරක්ෂා වේය
යන සනාථන දහම සිත්තුළ දැරිය යුතුය
විවිධ මට්ටමේ කුලක වලට නොබෙදී සමසිත්ව
කටයුතු කළොත් නව වසරේ ජය සිකුරුය

කුරිරු ම්ලේච්ඡ අපරාධ මිනිමැරුම් දූෂිත මග හැර
සුචරිතවත් දැහැමි අර්ථක්‍රමයක් ලගාකර
උදාර මිනිස් ගුණ සම්පත් හදවත් තුළ කැටිකර
ජීවත් වෙන්න මං පෙත් විවර වේවා නව වසර අතර

අනාගත අපේක්ෂා මල් එල දැළු දරන්නට
ලැබු වසර තෝතැන්නක් කර ගන්ට
නොබිඳෙන ආත්ම විශ්වාසයෙන් ගොස් පෙරට
තම ස්ථාවරය සවිමත්ව තහවුරු කරගන්ට

මොහොතින් මොහොත වෙනස්වන ලොවට අනුගතව
නව මුහුණුවරකින් යහපත් දේ ලංකර ගෙන නිරවුල්ව
ගැටලු සහිත ප්‍රශ්න වලට මුහුණ දී නොබියව
සාර්ථක දිවි මං පහදා ගත යුතුයි කාලය අනුව

සෙනෙහෙලත් රත්නායක
ග්ලෙන් වැවර්ලි

For all your Advertising needs
mihirie@pahana.com.au
Mihirie Dissanayake
0414 546 833